සියලු ම හිමිකම් ඇවිරිණි.

AAT SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2024-08-10
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**තිසේරා සහ සමාගම, සීමාසහිත Neutral පොදු සමාගම** සඳහා අභිනවයෙන් පත්කරන ලද විගණක වේ. විගණන කමිටුව සමඟ සිදුකරන ලද පළමු සාකච්ඡාවේදී විගණන කමිටුවේ සභාපතිවරයා විසින් විගණකවරයාගේ "භාරකාරීත්වයේ භූමිකාව (stewardship role)" පිළිබඳව සඳහන් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත Neutral පොදු සමාගමේ** කොටස්හිමියන්ට, විගණනය වැදගත් වන්නේ ඇයිද යන්න සඳහා හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**"anything.lk"** යනු **සීමාසහිත Anything (පෞද්ගලික) සමාගමට** ("සමාගම") අයත් වෙබ් අඩවියයි. විකුණුම්කරුවන්ට ගාස්තුවක් ගෙවා ඔවුන්ගේ වෙළෙඳ දැන්වීම් වෙබ් අඩවියෙහි පළ කිරීමටත්, ගැනුම්කරුවන්ට වෙබ් අඩවියට පිවිස විකුණුම්කරුවන් හා සම්මුඛ වී අවශ්‍ය කරන නිෂ්පාදිත මිලදී ගැනීමටත් හැකියාව ඇත. ඔබ, මෙම සමාගමේ ගණකාධිකාරීවරයා වශයෙන් මෑතකදී පත්වීම් ලබා ඇත.

සමාගම, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ සමාගමක් බැවින්, තොරතුරු තාක්ෂණයට අදාළ අවදානම්වලට මුහුණ දේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගමට, එහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේදී යොදාගත හැකි තොරතුරු තාක්ෂණයේ ඇති අවදානම් කළමනාකරණ උපකරණ / මෙවලම් (management tools) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

COSO අභ්‍යන්තර පාලන පද්ධති ආකෘතිමය රාමුව මගින් අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණු තුන අතුරෙන් එකක් ලෙස "මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය" හඳුනාගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) COSO අභ්‍යන්තර පාලන පද්ධතියේ ආකෘතිමය රාමුව අනුව, "මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය" යන අරමුණ **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) අභ්‍යන්තර පාලන පද්ධතියක සංරචක (components) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**AJP සහ සමාගම** යනු විගණන සමාගමක් වන අතර, එම ආයතනය එහි තත්ත්ව පාලන අවශ්‍යතාවයන් ළඟාකර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාල විගණන ලිපිගොනු අධීක්ෂණය හා සමාලෝචනය කිරීමේදී හවුල්කරුවන්ට හා කළමනාකරුවන්ට මාර්ගෝපදේශකයක් සැපයීම සඳහා ලේඛණයක් සකස් කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

තනි විගණන කාර්යභාරයන් (individual audit engagements) "අධීක්ෂණය" ට (Supervision) අදාලව ඉහත මාර්ගෝපදේශය තුළ ඇතුලත් කළ යුතු කරුණු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

ඔබ, **සීමාසහිත PQ සමාගමේ** වෙබ් අඩවියෙහි පළ කර ඇති "අභ්‍යන්තර විගණකයෙකු" සඳහා වන රැකියා ඇබෑර්තුවක් සඳහා අයදුම් කර තිබේ. එම රැකියාවෙහි වගකීම් ලෙස පහත දෑ රැකියා ඇබෑර්තුවෙහි විස්තර කර ඇත:

*"අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම."*

සමාගමට සුපිරි වෙළෙඳසැල් 11 කින් සමන්විත වෙළෙඳසැල් ජාලයක් පවතින අතර, ඒවා බස්නාහිර පළාත තුළ පිහිටා ඇත. අභ්‍යන්තර විගණක ලෙස ඔබට කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙහි සේවය කිරීමට සිදු වේ.

සමාගමේ සභාපතිවරයා සමාගම පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් සිදුකිරීමෙන් පසුව අමතර පාලන ක්‍රියාකාරකම් ස්ථාපිත කළ හැකිදැයි සම්මුඛ පරීක්ෂණයේදී ඔබගෙන් විමසන ලදී.

පාලනයන් ස්ථාපිත කිරීම මගින් සමාගමෙහි වංචා හා වැරදි මත වන අවදානම ඉවත් කිරීම සඳහා සමාගමේ විගණක ලෙස ක්‍රියාකළ හැකිදැයි ඉන් අනතුරුව ඔහු ඔබගෙන් විමසා සිටියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එකිනෙකට උදාහරණයක්ද සහිතව "පාලන ක්‍රියාකාරකම්" දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(b) පාලනයන් ස්ථාපිත කිරීම මගින් වංචා සහ වැරදි මත ඇති අවදානම් ඉවත් කිරීමට විගණකවරයාට හැකියාව ඇත්දැයි **විමසන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සුරාජ් සමාගම,** දේශීය වෙළෙඳපොළ සඳහා ඇඟළුම් නිෂ්පාදනය කිරීමෙහි නිරතව සිටින සමාගමකි. එහි කර්මාන්තශාලාව තුළ සේවකයින් 100 දෙනෙකුට වඩා සේවය කරන අතර, මූල්‍ය දෙපාර්තමේන්තුව තුළ ගණකාධිකාරීවරයෙක්, ගිණුම් විධායකයින් දෙදෙනෙක්, එක් ගිණුම් සහායකයෙක් සහ මුදල් අයකැමියෙක් වශයෙන් සේවකයින් 5 දෙනෙකු සිටී. සියලුම ගෙවීම් ගිණුම් සහායක විසින් සිදුකරන අතර, ඇය සුළු මුදල් අග්‍රිමයද පවත්වාගෙන යයි. සමාගමේ එදිනෙදා වියදම් සඳහා දිනකට රු.10,000/- ක මුදලක් තබා ගනිමින් ඉතිරිය දවස අවසානයේදී දෛනිකව මුදල් අයකැමි විසින් බැංකුගත කරයි.

මූල්‍ය දෙපාර්තමේන්තුව තුළ සිටින ගිණුම් විධායකයෙකු විසින් අතිකාල ගෙවීම් ගණනය කර එක් එක් සේවකයාගේ බැංකු ගිණුමට ගිණුම්ගත කරනු ලබයි. එය **සීමාසහිත සුරාජ් සමාගමේ** කර්මාන්තශාලා කළමනාකරු විසින් එවනු ලබන පැමිණීමේ ලේඛණය මත පදනම්ව ගණනය කරනු ලබයි.

එක්සෙල් සටහනකට (Excel Sheet) එක් එක් ණයගැතියාගේ ලෙජර් තොරතුරු හුවමාරු කිරීම මගින් ණයගැති ප්‍රකාශන පිළියෙල කරනු ලබයි. අස්ථාන ගතවූ හෝ ද්විත්ව ලෙස සටහන් වූ විකුණුම් ඉන්වොයිසි විස්තර හේතුවෙන් පියවීමේදී නිරන්තරයෙන් මතභේද හට ගනී. ණයගැති ලෙජරයට ප්‍රවේශවීමට සහ ණයගැති ප්‍රකාශන පිළියෙල කිරීමට ගිණුම් විධායකයෙකුට අවසර ඇත. ඔහු කාර්යබහුල වන විට, ගිණුම් සහායක විසින් ණයගැති ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

වර්ෂය තුළදී, නව තොග පාලන පද්ධතියක් හඳුන්වාදෙනු ලැබුවද, පද්ධතිය ක්‍රියාකරන්නේ කෙසේද යන්න පිළිබඳව සේවකයින්ට අවබෝධයක් නොමැති බැවින් භෞතික තොග ශේෂ හා පද්ධතියේ තොග වාර්තා අතර සැලකිය යුතු වෙනස්කම් තිබේ. තවද, සමහරක් තොග දත්ත ප්‍රධාන ලිපිගොනුවෙන් මකා දමා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත සුරාජ් සමාගමේ** අභ්‍යන්තර පාලන දුර්වලතා තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) ඉහත (a) හි හඳුනාගන්නා ලද එක් එක් දුර්වලතාවය මග හරවා ගැනීම සඳහා යෝජනාවක් බැගින් **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා **සීමාසහිත සුරාජ් සමාගමේ** කළමනාකාරීත්වයට ස්ථාපිත කළ හැකි පොදු පාලන දෙකක්(02) එකිනෙකට උදාහරණයක් සහිතව **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත XYZ සමාගම,** දැනට සිටින විගණක ඉවත් කර 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත විගණක ලෙස **RK ඇසෝසියේට්ස්** පත්කිරීමට සලකා බලමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත XYZ සමාගමේ** ව්‍යවස්ථාපිත විගණක ලෙස පත්වීම බාරගැනීමට පෙර **RK ඇසෝසියේට්ස්** විසින් කළ යුතු ක්‍රියාපටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **පෙරේරා, සිල්වා** සහ **කුරේ** වරලත් ගණකාධිවරුන්ගේ ආයතනයක් වන **PSC ඇසෝසියේට්ස්** හි හවුල්කරුවෝ වෙති. **PSC ඇසෝසියේට්ස්** ට අදාල පහත කරුණු සලකා බලන්න:

(1) **පෙරේරාගේ** බිරිඳ, මූල්‍ය පාලක (Finance Controller) ලෙස **PSC ඇසෝසියේට්ස්** හි සේවාදායකයෙකු ළඟ සේවයට බැඳී ඇත.

(2) **සිල්වා, PSC ඇසෝසියේට්ස්** විසින් විගණනය කරනු ලබන ඒකක භාරයක ආයෝජනය කර ඇත.

(3) **PSC ඇසෝසියේට්ස්** විසින් විගණනය කරනු ලබන බැංකුවකින් විශාල ණය මුදලක් (රු. මිලියන 10 ක්) **PSC ඇසෝසියේට්ස්** සඳහා සංකීර්ණ විගණන පද්ධතියක් මිලදී ගැනීම සඳහා ලබාගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් කළ එක් එක් සංසිද්ධිය **PSC ඇසෝසියේට්ස්** විසින් සලකා බැලිය යුත්තේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.**

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත Sunflower පොදු සමාගම,** ටයිල් කැට (tiles) විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. වරලත් ගණකාධිකාරී ආයතනයක් වන **ABC සහ සමාගම**, 2019 වර්ෂයේ සිට **සීමාසහිත Sunflower පොදු සමාගමෙහි** විගණක වන අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තවමත් විගණනය කරමින් සිටී. මූල්‍ය වර්ෂයට පසුව නමුත් විගණනය ආරම්භ කිරීමට පෙර **සීමාසහිත Rose පොදු සමාගම** විසින් **සීමාසහිත Sunflower පොදු සමාගම** අත්පත් කරගන්නා ලදී.

සමාගමේ විගණන හවුල්කරුවන් මාරු කිරීමේ ප්‍රතිපත්තිය මත විගණන හවුල්කරු වෙනස් කර ඇත. **සීමාසහිත Sunflower පොදු සමාගමේ** නව විධායක සභාපති සමඟ පැවති ආරම්භක රැස්වීමේදී, **සීමාසහිත Sunflower පොදු සමාගම** විසින් නව තොග පද්ධතියක් ස්ථාපිත කරන ලද බවත්, එම නව පද්ධතියේ ඇති තොග පාලන පද්ධතිය විගණක විසින් විගණන ක්‍රියාපටිපාටි සිදුකිරීමේදී සත්‍යාපනය කරන බවට බලාපොරොත්තු වන බවත්, ඔහු විසින් සඳහන් කරන ලදී.

විගණක විසින් බදු පෙර ලාභය මත නිශ්චය කරන ලද ප්‍රමාණාත්මක මට්ටම රු.1,250,000/- කි.

විගණනය අතරතුර විගණන කණ්ඩායම විසින් පහත සඳහන් අවප්‍රකාශන (misstatements) හඳුනාගෙන ඇත:

(1) පද්ධතිය මගින් ජනනය කරන ලද තොග වාර්තාව සහ භෞතික තොග ආගණන වාර්තාව අතර රු.997,000/- ක වෙනසක් ඇත. පද්ධති වාර්තාවේ සඳහන් අගය, භෞතික තොග වාර්තාවේ අගයට වඩා වැඩිය. පද්ධතියේ පවතින තොගයේ අගය, මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ කර ඇත.

(2) විකුණුම් ඉන්වොයිසිවල නියැදි පරීක්ෂාවේදී ඉන්වොයිසි 7 ක් විශේෂිත බව අනාවරණය වූ අතර, ඒවායේ අගය රු.334,000/- කි.

(3) ක්ෂය අනුපාත වැරදි ලෙස යොදා ගැනීමක් නිරීක්ෂණය වී ඇති අතර, එහි බලපෑම අගය කර ඇත. ඒ අනුව, රු.367,000/- ක ප්‍රමාණයක් පෙර වර්ෂවලට අදාල වන අතර, රු.24,000/- ක් ප්‍රවර්තන වර්ෂයට අදාල වේ. කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමටත් ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් එකඟ වී ඇත.

(4) විගණනය බාර හවුල්කරු වෙනස් වුවද එය පුනරාවර්තන විගණනයක් නිසා විගණන කළමනාකරු විසින් සේවයේ යෙදීමේ ලිපියක් පිළියෙල කර නොමැත. කෙසේවෙතත්, එය පුනරාවර්තන විගණනයක් වුවද, හවුල්කරු වෙනස්වීම නිසා සේවයේ යෙදීමේ ලිපියක් යැවිය යුතුයැයි නව විගණන හවුල්කරුගේ මතය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග (elements) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) සේවයේ යෙදීමේ ලිපියක (engagement letter) නියමයන් වෙනස් කළ හැකි තත්ත්වයන් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත Sunflower පොදු සමාගමේ** කළමනාකාරිත්වයෙන් විමසීම් කළ යුතු කරුණු ඇතුළත් ලැයිස්තුවෙහි ඇතුළත් කළයුතු කරුණු පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(d) **විගණනයේදී** ප්‍රමාණාත්මක බවේ තක්සේරුව වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(e) පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන් [Those Charged with Governance (TCWG)] සමඟ සන්නිවේදනය කිරීමට පෙර විගණනයේදී හඳුනාගන්නා ලද ඉහත අවප්‍රකාශන ඇගයීමට ලක් කළ යුත්තේ කෙසේදැයි **පැහැදිලි කරන්න.**
(ලකුණු 06)
(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත New World පොදු සමාගම (NW)** විසින් කොළඹ 02 ප්‍රදේශයේ පිහිටා ඇති සුඛෝපභෝගී සාප්පු සංකීර්ණයක් අයිතිය ඇතිව පවත්වාගෙන යනු ලබයි. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනය තවමත් කරගෙන යමින් පවතී. සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා සමාගම විසින් ඉඩම සහ ඉදිකරමින් පැවති සාප්පු සංකීර්ණය ඇපයට තබා විශාල ප්‍රමාණයේ බැංකු ණයක් ලබාගෙන ඇත.

රට තුළ පවතින ආර්ථික වාතාවරණය හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී සහ පසුගිය වර්ෂයේදී NW විසින් මෙහෙයුම් අලාභ දරා ඇත. මේ හේතුවෙන් NW හි ණය වාරික හයක් (06) හිඟව පවතී. විගණනයේදී ණය සත්‍යාපනය කිරීම සඳහා විගණන කණ්ඩායමේ ආධුනික සාමාජිකයෙක් වන **රංගා** ව පත්කර ඇත. බැංකුව සමඟ සිදුකළ ලිපි ලේඛණවලට අනුව NW විසින් ණය කොන්දේසි උල්ලංඝණය කර ඇති අතර, ඉඩම සහ ගොඩනැගිල්ල අත්පත් කරගැනීම මගින් ණය මුදල පියවා ගැනීමේ නෛතික කටයුත්තේ පළමු පියවර ලෙස එන්තර වාසියක් (letter of demand) බැංකුව විසින් එවා ඇත. ණය කොන්දේසි අනුව ස්කන්ධයට ණය අනුපාතයද ඇතුළුව සමහරක් මූල්‍ය අනුපාතයන් යම් මට්ටමක පවත්වා ගැනීමට NW ට සිදුවේ. කෙසේනමුත්, කළමනාකාරිත්වය විසින් මේ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොමැති අතර, ඒ පිළිබඳව විගණකට දැනුම්දීමක්ද සිදුකර නොමැත. ගෙවිය යුතුව පවතින ගෙවිය යුතු ඉතිරි ණය මුදල සම්බන්ධයෙන් ඍජු තහවුරු කිරීමක් (confirmation) ලබාගන්නා ලෙසට **රංගා** විසින් NW වෙත දැනුම් දීම හැර මේ සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලබාගැනීම සඳහා **රංගා** විසින් වෙනත් කිසිදු විගණන ක්‍රියාපටිපාටියක් සිදුකර නොමැත.

බදු පෙර ලාභය පදනම් කර ගනිමින් රු.3,456,000/- ක ප්‍රමාණාත්මක මට්ටම නිශ්චය කර ඇත. NW විදුලිය විසන්ධි කර ඇති අවස්ථාවලදී විදුලිය ලබාගැනීම සඳහා ඉහළ තාක්ෂණයෙන් යුත් ජෙනරේටරයක් වර්ෂය තුළදී ආනයනය කර ඇත. දැනට පවතින ආනයන සීමා හේතුවෙන්, ජෙනරේටරය ආනයනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා ගෙවූ රු. මිලියන 5 ක විශේෂ ගෙවීමක් ප්‍රාග්ධනීත කර ඇත. චෙක්පත මගින් ගෙවන ලද ගෙවීම, බැංකු ප්‍රකාශනයේ සඳහන් වීම හැර වත්කමක් ලෙස ප්‍රාග්ධනීත කළ මෙම මුදල සාධාරණීකරණය කිරීම සඳහා කිසිදු උපකාරක ලියවිල්ලක් ලබා දීමට NW ට නොහැකි වී ඇත. එමනිසා එම මුදල වියදමක් ලෙස සැලකීමට විගණක යෝජනා කර ඇත. NW එම ගැලපීම සඳහා එකඟ වී නොමැති අතර, විශේෂ ගාස්තුව ප්‍රාග්ධන වියදමක් වන බවට වූ කළමාකාරිත්ව නියෝජනයක් (representation) ලබාදීමට එකඟ වී ඇත.

දේපළ, පිරියත සහ උපකරණ භෞතික වශයෙන් සත්‍යාපනය කිරීමේදී වායුසමන යන්ත්‍ර පහක් (05) භෞතිකව නොමැති බවට නිරීක්ෂණය විය. ආරක්ෂක නිලධාරියා විසින් වාචිකව තහවුරු කරන ලද්දේ නඩත්තු කටයුතු සඳහා ගිවිස ගත් තුන්වන පාර්ශවයක් විසින් නිරන්තරව සිදුකළ යුතු සේවා කටයුත්තක් වෙනුවෙන් එම යන්ත්‍ර ගෙනගොස් ඇති බවයි. තවද, සමාගමෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් දෙදෙනෙක් ඉවත් වී ගොස් ඇති අතර, එම තනතුරු තවමත් පුරප්පාඩුව පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සංසිද්ධියෙහි සඳහන් පහත සඳහන් විගණන සාක්ෂිවල විශ්වසනීයත්වය **තක්සේරු කරන්න**:

- ණය මුදල සම්බන්ධයෙන් බැංකුවෙන් ඍජු තහවුරු කිරීමක් ලබා ගැනීම.
- විශේෂ ගාස්තුව, ප්‍රාග්ධන වියදමක් ලෙස සළකා බැලීම වෙනුවෙන් වූ විගණන සාක්ෂි ලෙස කළමනාකරණ නියෝජනයක් ලබා ගැනීම.
- ආරක්ෂක නිලධාරියාගෙන් ලබා ගත් වාචික තහවුරු කිරීම. (ලකුණු 06)

(b) ණය සම්බන්ධයෙන් වූ විගණන සාක්ෂි ලබා ගැනීමේදී, ණය මුදල මත තහවුරු කිරීමක් ලබා ගැනීමේ ක්‍රියාපටිපාටියේ යෝග්‍යතාවය **විමසන්න**. (ලකුණු 04)

(c) විගණන මතයට "විශේෂ ගාස්තුව" මගින් සිදුකරනු ලබන බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(d) විගණක විසින් විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුළත් කිරීමට සළකා බැලිය හැකි අවස්ථාවන් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(e) NW හි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සැකයක් ඇති කළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් (events and conditions) පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |